# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1988 අංක 28 දරන
## මහජන ආරක්ෂක (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 27 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 ජූලි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 28 දරන මහජන ආරක්ෂක (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 27 වන දින]

එල්.ඩී.-ඕ.34/87

**මහජන ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 28 දරන මහජන ආරක්ෂක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

40 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(2අ) (අ) 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයක් බල පැවැත්වීම අවසන් වන විට හෝ අවසන් වීමට පෙරාතුව, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වැඩිදුර ප්‍රකාශනයක් කරනු ලබන අවස්ථාවක, ඒ වැඩිදුර ප්‍රකාශනය ක්‍රියාත්මක වන්නා වූ දිනයට පෙරාතුවම වූ දිනයෙහි බලාත්මකව පවතින හෝ බලාත්මකව පවතින්නේ යැයි සැලකෙන,—

(i) 5 වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ; සහ

(ii) එවැනි නියෝගයක් යටතේ සාදන ලද සෑම නියමයක් ම සහ රීතියක් ම

ඒ වැඩිදුර ප්‍රකාශනය ක්‍රියාත්මක වූ දිනයෙහි සිට සහ ඉන් පසුව බලාත්මකව පවත්නා සේ සැලකෙන්නේය :

එසේ වුව ද ජනාධිපතිවරයා විසින්, ආඥාවක් මගින්, ඒ ආඥාවේ නිශ්චය කොට දැක්වෙන යම් නියෝගයක්, නියමයක් හෝ රීතියක්, ඒ වැඩිදුර ප්‍රකාශනය ක්‍රියාත්මක වීමේ දී බලාත්මකව පවත්නා ලෙස නොසැලකිය යුතු බවට හෝ ඒ ආඥාවෙහි දක්වා ඇති සංශෝධනවලට හෝ සුළු වෙනස් කිරීම්වලට යටත්ව බලාත්මකව පවත්නා ලෙස සැලකිය යුතු බවට හෝ, එම වැඩිදුර ප්‍රකාශනය ක්‍රියාත්මක වන්නා වූ දිනයට පෙරාතුව කවර හෝ වේලාවක දී ප්‍රකාශයට පත් කළ හැකි ය.

(ආ) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනයක් ක්‍රියාත්මකව පවත්නා කාලය තුළ 5 වන වගන්තිය යටතේ නියෝග සෑදීමේ හෝ බලාත්මකව පවත්නා හෝ බලාත්මකව පවතින්නේ යැයි සැලකෙන එවැනි යම් නියෝගයක්, නියමයක් හෝ රීතියක් සංශෝධනය කිරීමේ, වෙනස් කිරීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ජනාධිපතිවරයාගේ බලයට මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් හානියක් නොවන්නේ ය.”.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.